කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2024

2026 - අප්‍රේල්

**BCOME 1015 - කළමනාකරණ මූලධර්ම**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ) නූතන සංවිධාන සඳහා කළමනාකරණයෙහි ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) "කළමනාකරුවන්ට තාක්ෂණික (technical), මානව (human) සහ සංකල්පීය (conceptual) කුසලතා එකතුවක් තිබිය යුතුය." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ) සංවිධානයක විවිධ කළමනාකරණ මට්ටම් පැහැදිලි කර එක් එක් මට්ටම්වල ප්‍රධාන වගකීම් විස්තර කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

අ) කළමනාකරණයේ ප්‍රධාන කාර්යය සැලසුම් කිරීමයි." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) සංවිධානයක සාර්ථකත්වය සඳහා සැලසුම් කිරීමේ වැදගත්කම විශ්ලේෂණය කරන්න. ඔබේ පිළිතුරට සහාය වීම සඳහා උදාහරණ සපයන්න.

(ලකුණු 07)

ඇ) උදාහරණයක් භාවිතා කරමින් සංවිධානයක සැලසුම් ක්‍රියාවලියට සම්බන්ධ පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) "සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානකරණය අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) අධිකාරිය පැවරීමේ සංකල්පය (Concept of delegation of authority) සහ සංවිධාන තුළ එහි වැදගත්කම සාකච්ඡා කරන්න. උදාහරණ සපයන්න.

(ලකුණු 07)

ඇ) සංවිධාන තුළ අධිකාරිය මධ්‍යගත (Centralization) කිරීම සහ විමධ්‍යගත (Decentralization) කිරීම අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 08)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) නායකත්වය නිර්වචනය කර එහි ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) සංවිධානවල සේවක කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේදී නායකත්වයේ වැදගත්කම විශ්ලේෂණය කරන්න. උදාහරණ සපයන්න.

(ලකුණු 07)

ඇ) විවිධ නායකත්ව විලාසයන් උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 08)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ) "පාලන ක්‍රියාවලිය මගින් ආයතන ක්‍රියාකාරකම්, සැලසුම් කළ අරමුණු සමඟ පෙළගැසී ඇති බව සහතික කරයි." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) "ඵලදායී පාලනයක් සඳහා කාර්ය සාධන ප්‍රමිතීන් අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ) සංවිධානවල පාලන පද්ධති ක්‍රියාත්මක කිරීමේදී කළමනාකරුවන් මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. උදාහරණ සපයන්න.

(ලකුණු 08)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

ඇ) "සන්නිවේදනය යනු සංවිධානයක ජීවනාලියයි." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) ඉහළට (upward), පහළට (downward) සහ පාර්ශ්වීය (lateral) සන්නිවේදනය සාකච්ඡා කරන්න. උදාහරණ සපයන්න.

(ලකුණු 07)

ඇ) සංවිධානවල ඵලදායී සන්නිවේදනයට ඇති බාධක පැහැදිලි කරන්න.

(ලකුණු 08)
**(මුළු ලකුණු 20)**